## සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**2 ශ්‍රේණිය - බුද්ධධර්මය 2021 පෙබරවාරි 3 සතිය**

**සැකසුම = බලංගොඩ අධ්‍යාපන කලාපය**

R.G.N.K .ස්වර්ණමාලි. ර/බල/කරගස්තලාව ප්‍රාථමික විද්‍යාලය

### බොදු දරුවකුගේ දින චර්යාව

දුවේ, පුතේ සුනිමල් පිළිවෙළකට වැඩ කරන හොඳ දරුවෙකි. ඒ නිසා අපිත් දින චර්යාවකට අනුව කටයුතු කරන්න පුරුදු වෙමු.

(1). ඔබ පාසල නිමවී නිවසට ගොස් රාත්‍රී නින්දට යන තෙක් දවස ගත කරන අයුරු ලියා දක්වන්න.

(2). ඉන් කැමති අවස්ථා චිත්‍රයට නඟන්න.

ඔයාලා දන්නවාද දින චර්යාවකට අනුව කටයුතු කිරීමෙන් අපටවාසි ලැබෙන බව. අපි බලමු මොනවද කියල ඒ ,

- අපේ කාලය ඉතිරි වෙනවා.
- වැඩ අතපසු නොවීම.
- නිරෝගීව සිටීම.

(1). දින චර්යාවට අනුව වැඩ කිරීමෙන් ඔබට ලැබෙන වාසි කිහිපයක් ලියා දක්වන්න.

(2) සාධු චර්යා නමින් පොතක් සාදා දිනපතා හොඳ වැඩක් ලියා එය චිත්‍රයට නඟන්න.

(3) පහත සඳහන් වැකි හරි නම් (✓) ලකුණද වැරදි නම් ( × )ලකුණද යොදන්න.

- හොඳ ළමයා උදේන්ම නැඟිටියි. ( )
- දින චර්යාවට අනුව වැඩ කිරීමෙන් කාලය ඉතිරි වේ ( )
- පිරිසිදුව සිටීම යහපත් පුරුද්දකි. ( )
- උදේ සවස බුදුන් වැඳීම යහපත් ක්‍රියාවකි. ( )
- නිරෝගී ව සිටීමට පෝෂ්‍යදායි ආහාර ගත යුතුය. ( )